# රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G. O. B. A.)

## ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී තනතුර වන ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුරට ද්විතීයන පදනම යටතේ පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම් :

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරියෙකු වීම,
- ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම,
- කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම, හෝ
- කළමනාකරණ සේවා නිලධාරී හෝ සමාන්තර සේවයේ I වන පන්තියේ නිලධාරියෙකු වීම හෝ ඉන් ඉහළ පන්තියක වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/වානිජ්‍ය විද්‍යා උපාධි හෝ ඊට සමාන සුදුසුකම් සහිත නිලධාරියෙකු වීම.

2. අවශ්‍යතා

2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය,
2.2 2024.04.01 දිනට වයස අවු. 55ට වැඩි නොවීම,
2.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක් තිබීම,
2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රමාණික දැනුමක්/හැකියාවක් තිබීම,
2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E-mail භාවිතා කිරීමේ හැකියාව,
2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව,
2.7 දෙමළ භාෂාව දැන සිටීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ඇත,
2.8 අවම වසර 2ක ද්විතීයන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානී/පත්වීම් බලධාරීගේ කැමැත්ත

3. වැටුප :

3.1 අයදුම්කරු රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා
3.2 සංගමය විසින් ලබා දෙන මූලික වැටුපෙන් 50% ක් වූ දීමනාව,
3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2020 අනුව විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කිරීම සඳහා මූලික වැටුපෙන් 25%ක් ප්‍රේෂණය කරනු ඇත.

4. රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම (අංක 2310/29 දරන 2022 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව)
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 166 සමග කියවිය යුතු 178 වන රීතිය අනුව - පරිශිෂ්ට අංක 12 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවයද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (www.psc.gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය භාගත කළ හැක.)

**2024.04.29 දින දහවල් 12.00** ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් (ඉහත 4.1 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩී. එන්. පී. දුනුසිංහ,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

දුරකතන අංක : 011-2434598, 2473633, 2473577